# සෙලෙස්තිනාලා බලන්න කොළඹ ආපු හැටි

ජගත් රණතුංග



කැළණි ගඟේ පාරු පාලම

අශෝක කෝවිලගේ ලියා, රෝහණ වීරසිංහ තනුවක් නිමවා, සුනිල් එදිරිසිංහ ලවා ගායනා කරවන ඒ මනරම් මධුර ගීතය සම්පූර්ණයෙන්ම අත්ත-මුත්ත කාලේ ජවනි කාවකි.

සෙලෙස්තිනාලාගේ කාලයේ ගම්පහ පැත්තේ සිට කොළඹ පැමිණි වියෝලිස් ආතා ගැන ආරංචිය ලැබෙත්ම මසිතෙහි පිළිසිඳුණේ අත්ත-මුත්ත කාලේ වගවිත්ති දැන කියාගැනීමේ නොතිත් ආසාවකි. ඒ නොතිත් ආසාව කිසිවකුටවත් නොපෙ-නෙන්ට පැසක ලාගෙන එක් සති අන්ත ශනිදාවක මා ඒ වියෝලිස් ආතා හමුවීමට යකඩ අසු පිට නැගුනේ ගම්පහ කිරිඳිවිටට ගොස් උදේ වරුවක්ම ඊට වෙන් කරන්නට සිතාගෙනය.

එය එසේම සිදු වූ නමුත් කරදරයකට තිබුණේ වියෝලිස් ආතාගේ කන් ඇසීම සියයට අනූවකින් පමණ නරක අතට හැරී තිබීමය. මගේ උගුර ලේ රහ වනතුරු ආතා හමුවේ යටි ගිරියෙන් හා උස් හඬකින් සාමීචියේ යෙදීමට සිදුවීමය. අවුරුදු අනූවට



වියෝලිස් ආතා

ඉතා ආසන්න වීමේ වයස නිසා වියෝලිස් ආතලාට එසේ කාලය තරවටු කරන මුත් හැම ආතා කෙනකුටම එසේ නොවන බව නොදන්නා කිසිවකු නැත.

වියෝලිස් ආතා තනිකඩයෙකි. තමන්ට දකින්න අහන්න ලැබුණු නොයෙකුත් විනැම්බෑසි කන්දරාව නිසා එසේ නිගමන දෙනවාද, තමන්ට වූ අහිමි වීම් සියල්ල නිසා එසේ කියනවා දැයි මා දන්නේ නැත.

"මොකෝ පවුලක් පන්සලක් වුණෙ නැත්තෙ?"

හේතුව නිශ්චිතව දැනගත යුතුය.

මේ ඊට පිළිතරු දෙන ආතාය.

"මායි අම්මයි මල්ලියි විතරයි අපේ පවුලෙ හිටියෙ. මල්ලි බැන්දා. අම්මට මළ පෙරේතයෙක් වැහුණා. ඒකට මං තොවිල් පවිල් කළා. හොඳ කරගන්න බැරි වුණා. මල්ලිගෙ ළමයින්ගෙයි, අම්මලගෙයි වැඩ කළා, කාලෙ ඉගිලුණා. තාත්තෙක් හිටියෙ නෑ."

අර මළ පෙරේතයා වැහීම මට මහ අමුත්තකි. හාරා ඇවිස්සිය යුතු තරමේ.

"මේකනේ මහත්තයා. මම අවුරුදු පනහක් හැටක් තිස්සේම කරන්නෙ යක්කු බැඳගෙන වැඩගත්තු එකනෙ. මම අණාවිණ, කොඩිවිණ කපන්න නොගිය පළාතක් නෑ. මමයි ජානිසුයි, චාර්ලිසුයි එක්කාසු වෙලා කට්ටඬියෝ හතර දෙනෙකුයි, බෙරකාරයො දෙන්නකුයි



පිටකොටුව එදා

අඩගසාගෙන පිදේනි තටු හදාගෙන කරත්තෙන් වගේම පයිනුත් ගියේ බිලිපඬුරු තුනකුත් අරං."

"බිලි පඬුරු?"

මම ඇසුවේ ඒවා පරණම විය හැකි නිසාය.

"හදිසියේවත් ආතුරයා බිල්ලක් ඉල්ලුවොත් දෙන්නෙ කුකුළෙක් නැත්නම් එළුවෙක්. ඒත් නැත්නං මොනරෙක්. කවදාවත් ආතුරයා වෙන බිලි නම් ඉල්ලන්නෙ නෑ. කොඩිවිණයක් කපන්න මං පාසිකුඩාත් ගිහින් තියෙනවා ඒ කාලේ."

හතේ කැලෑසියට පමණක් අස්ගිරිය ඉස්කොලෙ ගිය වියෝලිස් ආතාට ඉන් එහා යන්නට බැරි වුණාය කියන්නේ තම අම්මාට මළ පෙරේතයකු වැසීමය. තොවිල් පවිල්, අණා*විණ, කොඩිවිණ පසෙකින් තබා අපේ සාමීචිය දැන් ආතා කොළඹ ආපු හැටි දෙසට යොමු කළ යුතු යැයි මම සිතුවෙමි. කරත්තෙන් කොඩිවිණ කපන්න කොළඹත් ගියාද ආතා.

ඒ මගේ හැරවුමයි.

"මට සන්තකේට කරත්තයක් තිබුණෙ නෑ. කුලියටයි කරත්තෙ ගත්තෙ. මායි ජානිසුයි, චාර්ලිසුයි එක්කහු වෙලා කරත්තෙ බඩු පටවාගෙන කොළඹ ගියා, ඒවා විකුණං එන්න."

මොන බඩුද?

"පොල්, කෙසෙල්, කොස්, දෙල්, වගේම කොස්ගස් හන්දියෙ ලී මඩුවකට පොල් පරාල.□

ඒ ආතා ගැටවර විය පහුවේගෙන එද්දීය. ගොනු බැඳි කරත්තයේ පඩංගුවේ කෑම්බීම් හා වතුරය. සතාට තණකොළ ඇති තරම්මය. උදේ පටන්ගන්න ගමන බිංකළුවර වැටෙන තුරුම ඉවර අහවර වෙන්නේ නැත. කරත්තය දෙපැත්තේ පැද්දි පැද්දී එල්ලෙන ලැන්තෑරුම් දෙකකි. ගමනේ දහවල් වෙද්දී සතා නෑවිය යුතුය. ඊට කැලණියේ පට්ටිය හන්දිය තිබේ.

"පට්ටිය හන්දියට ඒ නම ලැබුණේ ගොනුන් ලෙහුවෙ ඒ හන්දියේම නිසා. අපේ ජානිසුයි, චාර්ලිසුයි දෙන්නා නං කඳානෙ තිබුණු අරක්කු රේන්ද පොළකින් සප්පායනුත් වුණා. මම නං කටේවත් තිබ්බෙ නෑ. මං බීම සදහටම නැවැත්තුවේ එකදාස් නවසිය පනස් දෙකේදී. බීම නතර කළා කළාමයි. නමුත් අතරමගදී සතේට ගිරවා ලකුණෙ බීඩි දෙකක් අරන් ඉණේ ගහගන්නවා පස්සෙ බොන්න. බුලත් විටත් සෑහෙන්න කෑවා. බත්පතක් කෑවෙ සත දෙකට. ජාඇලෙන්.

අපි කිරිඳිවැටට ගිහින් ජාඇල කඳාන පැත්තෙන් වගේම නුවර පාරෙනුත් කොළඹ ගිහින් තියෙනවා. කොළඹ ගිහිං නිකං කරත්තේ ආවේ නෑ. ගමේ මුදලාලිලාගෙන් ගත්ත ඕඩරුත් පටවාගෙනයි ආවේ. ඒ වගේම අපේ පංසලට විදුලි මෝටරේකුත් ගෙනාවෙ අපි."

හොර හතුරෝ එහෙමත් ඉන්න ඇති. කරත්තවලට පනින.

"ඔව් මහත්තයො. හොරු හිටියා මරැකලා. අපි උන්ට කොටන්න කඩුවකුත් හංගාගෙන අරං තමයි ගියේ ආරස්සාවට. ඒ වුණාට කාටවත් අපි කෙටුවෙහෙම නෑ. දවසක් හොරු පැන්නා නුවර පාරෙන් යන අපේ කරත්තෙට සුද්ද කරන්න බලාගෙන.

එවෙලේ කවුදෝ මහත්තයෙක් එක පාරටම එතෙන්ට කඩාපාත් වෙලා අර හොරුන්ට හොඳට නෙළුවා. තඩිබෑවා. මහහොරාට පයින් දමලා ගැහුවා. හොරු හිස්ලුලු අත දුවන්න ගත්තා. අපි බැලුවා කවුද මේ චණ්ඩියා කියලා. පස්සෙයි දැනගත්තේ ඒ අපේ අගමැතිතුමා, කියලා. ඒ, ඩී.ඇස්. සේනානායක මැතිතුමා වෙස් මාරුකරගෙන ඇවිත්."

ආතා විස්තර කළේ තම පිරිස මුහුණ දුන් ඇඟ සලිතකරන තරමේ අත්දැකීමකි.

එතකොට ආතෙ කරත්තෙන්ම කොළඹට සේන්දු වුණා.

"ඔව්. අපි ආවෙ කැලණි ගංතොටේ පාලම්පාරුව ගාවට. බෝට්ටු කිහිපයක් එකට පෙළගහලා ඒවා දම්වැල්වලින් එකට බැඳලයි තිබුණේ. ඒ නිසා ඒකට බෝට්ටු පාලම කියලත් කිව්වා. කරත්තෙ පිටිම්ම ඒකට නැග්ගුවේ සත පහට. අපි නගිනකොට තවත් කරත්ත දෙකතුනකුත් නග්ගලා තිබුණා. ඒක අපූරු හැන්දෑවක්. ගෑස්පහට එනකොට බිංකළුවරත් වැටිලා ටිකක් වෙලා ගතවෙලා.

පාලම් පාරුවෙන් එගං වෙලා අහකලා, යන්න වුණේ කයිමන් දොරකඩට. ඒතැන තමයි ඇතුල්වීමේ දොරටුව. ආපු හැමෝම එතැන තිබුණු ඝණ්ඨාර කුලුන නාද කරන්න ඕන."

මතු සම්බන්ධයි